**එකිනෙකා සමග සම්බන්ධ වුණ සමාජයක්**

# මොබයිල් ඉන්ටනෙට් කුසලතා පුහුණු ආධාරක

## මූලික මොබයිල් ඉන්ටනෙට් කුසලතා පිළිබඳ ජනතාව පුහුණු කිරීමට මගපෙන්වීමක්



Copyright © 2017 GSM Association

case.

# 5 වෙනි මොඩියුලය

## -විකිපීඩියා (Wikipedia)

# Bitesize Training

# ඒ කුමක්ද?


WIKIPEDIA
The Free Encyclopedia

ෆෝන්-එකෙන් විකිපීඩියා පෙන්වන්න


"Wikipedia යනු නොමිලේ ලැබෙන ඉන්ටනෙට් පරිශීලනයකි (හෝ විශ්වකෝෂයකි). එමගින්, අධ්‍යාපනික මාතෘකා පිළිබඳ අපක්ෂපාතී, සාධක මත පදනම් වූ තොරතුරු ලබාගත හැක. බොහෝවිට, Google මගින් සෙවීමේදී මුලින්ම පෙනෙන වෙබ් අඩවිය මෙයයි. නැත්නම්, ඔබ සොයන දේට අදාළ වචන සමග "wiki" ලෙස ටයිප් කිරීමෙන් ඔබට එයට පිවිසිය හැක."

" Wikipedia හි තොරතුරු ලියන්නේ, ලොව පුරා සිටින සාමාන්‍ය ජනතාවයි. සෑම පැයකදීම පාහේ එම අන්තර්ගතයන් වෙනස් කිරීම් ද සිදුවේ. සෑම පිටුවකම යට, එම පිටුවේ සඳහන් තොරතුරු උපුටාගත් මූලාශ්‍ර ලැයිස්තුගත කර තිබෙන නිසා, ඔබට ඔබ සොයාගත් තොරතුරුවල විශ්වාසනීයත්වය තහවුරු කරගත හැකිය."

## ඔබට ඕනෑවෙන්නේ මේවාය.



ස්මාර්ට් ෆෝන් එක




Wikipedia පෝස්ටර්

## එය යොදාගත හැක්කේ කුමක් සඳහාද?

"විවිධ විෂයයන් පිළිබඳ තොරතුරු සෙවීමට ඔබට Wikipedia භාවිතා කළහැක. උදාහරණ වශයෙන්, ක්‍රීඩා, සංගීතය, ඉතිහාසය, වෙනත් රටවල් හෝ විද්‍යාවට අදාළ තොරතුරු එමගින් සොයාගත හැකිය."


"Wikipedia භාෂා 300කින් පමණ සමන්විතය. ඒ සෑම එකක්ම ලියන්නේ ඒ ඒ භාෂාව කතාකරන අය විසිනි. ඒ නිසා සමහර භාෂාවලින්, වෙනත් භාෂාවලට වඩා ලිපි තිබේ. උදාහරණයක් ලෙස ගත්තොත්, රුවන්ඩාවේ භාවිතාවන අප්‍රිකානු භාෂාවක් වන 'කින්යාර්වන්ඩා' භාෂාවෙන් Wikipedia ලිපි 2,000ක් පමණ තියෙද්දී, ඉංග්‍රීසි බසින් ලිපි මිලියන 5කටත් වඩා තිබේ"

**පැහැදිලි කරන්න**: පුහුණුකරන්නා විසින් Wikipedia මගින් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ සිය පෞද්ගලික උදාහරණ මෙන්ම, එය භාවිතාකරන්නේ කුමන කටයුතු සඳහා ද යන්න පැහැදිලි කරදෙන්න.

පුහුණුවෙන්නාට **එය අදාළ කරන්න**: පුහුණුවෙන්නාගේම ජීවිතයේ කටයුතුවලදී මෙය ප්‍රයෝජනවත් වන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න.

## එය ක්‍රියාත්මක වෙන්නේ කෙසේද?

ෆෝන්-එක පුහුණුවන්නා අතට දී, මෙම පියවරවලට යාමට උදව්කරන්න




**Wikipedia භාවිතා කරන්නේ කෙසේද?**

පෝස්ටරය පෙන්වා, Wikipedia ලිපියක් සොයන ආකාරය පියවරෙන් පියවර විස්තර කරන්න.

(උදා: Sri Lanka, music හෝ World Cup).

# පුහුණුවෙන්න!

"**Wikipedia** භාවිතා කරන ආකාරය දැන් ඔබ දන්නවා, එය අවශ්‍ය වෙන්නේ කුමක් සඳහාද?"

පුහුණුකරුවා: පුහුණුවෙන්නාට ඔහු/ඇයගේ ෆෝන්-එකෙන් **Wikipedia** ලිපියක් සෙවීමට උදව් කරන්න

ඉඟිය: "Wikipedia හි ලිපි භාෂා 300කින් පමණ ඇත. ඒ ඒ ලිපි ලියා ඇත්තේ, ඒ ඒ භාෂාව කතාකරන අය විසිනි. ඒ නිසා සමහර භාෂාවලින්, වෙනත් භාෂාවලට වඩා ලිපි ඇත. උදාහරණ වශයෙන්, ස්වාහිලි භාෂාවෙන් ලිපි 35,000ක් පමණ තියෙද්දී, ඉංග්‍රීසි භාෂාවෙන් ලිපි මිලියන 5කටත් වඩා ඇත."

පැහැදිලි කරන්න: ඔබ Google හෝ Yahoo වැනි සේවාවක් මගින් ඉන්ටනෙට් හි තොරතුරු සෙවීමේ දී, එම ප්‍රතිඵල අතර Wikipedia ලැයිස්තුගතව තිබීමට හැක. බොහෝවිට, එවැනි සෙවීම් ප්‍රතිඵලයක ඉහළින්ම ඇත්තේ Wikipedia ය. ඔබට නිතරම යම් මාතෘකාවක් පිළිබඳ මූලික තොරතුරු සාරාංශයක් (overview) දැනගැනීමට Wikipedia යොදාගත හැකි අතර, ඉන් පසු ඒ ඔස්සේ තොරතුරු සොයමින් වඩාත් විශ්වාසනීය තොරතුරු සොයායාමට හැක.

# පෝස්ටර්,

# කටවුට් සහ

# තොරතුරු පත්‍රිකා











Icon Cutouts - Wikipedia






# Wikipedia


භාවිතා කරන්නේ කෙසේද?



# Wikipedia

## භාවිතා කරන්නේ කෙසේද?





# සහතිකය

**මූලික මොබයිල් ඉන්ටනෙට් කුසලතා පුහුණුව**

සම්පූර්ණ කරන ලදී

දිනය

අත්සන් කරන ලදී



# සහතිකය

**මූලික මොබයිල් ඉන්ටනෙට් කුසලතා පුහුණුව**

සම්පූර්ණ කරන ලදී

දිනය

අත්සන් කරන ලදී